# නැමදුම් අත්හැරීම

දෙවියන්වහන්සේ ඔබව මවා ඔබට සැම දේ ලබා දී ඇත "ඔහුයි ඔබව නිර්මාණය කර පෙනීම ඇසීම හා හදවත ආදිය දයාද කර දුන්නේ, නමුත් ඔබ කෘතඥ වන්නේ ඉතා අල්පයෙනි. " අල්-කුර්ආනය 67:23

සිට ගනිමින් නැමදුමේ යෙදීම නිසා නබි තුමාණන්ගේ පාදයන් ඉදිමී තිබුණි. ඒ ගැන විමසූ විට ''මාගේ ස්වාමියාට මා ස්තුතිපූරක සේවකයෙකු විය යුතු නොවේද?'' යැයි එතුමා විමසුවේ ය.

## ඔබට මැලි කමක් දැනේද?

ඔබට දිනකට පැය 24ක් ලබා දී ඉන් මිනිත්තු 30ක් පමණක් ඔහු වෙනුවෙන් වැය නොකිරීම වෙනුවෙන් ඔබේ මැවුම්කරුට විනිශ්චය දිනයේ දී ඔබට දිය හැකි නිදහසට කාරණා කුමක් වේද?

දිනක් නබි තුමාණන් මෙසේ පැවසීය,''ආදම්ගේ දරුවන් විනිශ්ච දිනයේදී කාරණා පහක් මත ප්‍රශ්න කරනු ලබයි. ඔහුගේ ජීවිතය හා එය කෙසේ ගෙවුනෙහි ද යන්නත් ඔහුගේ යෞවන කාලය හා එය කෙසේ වැය කළේ ද යන්නත් ඔහුගේ ධනයත් එය කෙසේ ඉපයුවේ ද කුමකට වියදම් කළේ ද යන්නත් ලබාගත් දැනුම කෙසේ ප්‍රයෝජනයට ගෙන ක්‍රියාවට නැගුවේ ද යන්නත් විමසනු ලැබේ''

## ඔබ කාලකණ්ණි පුද්ගලයෙකු වනු ඇත

දෙවියන්වහන්සේ මෙසේ පවසයි

"මගේ මතකයෙන් කවුරුන් ඇත් වන්නේද නියත වශයෙන්ම ඔහුගේ ජීවිතය ඔහුට ඉතාමත් අමාරු වනු ඇත . අපි විනිශ්චය දිනදී ඔහුව අන්ධයෙකු වශයෙන් නැගිට්ට වන්නෙමු. එවිට ඔහු "මගේ දෙවියනේ! ඔබ කුමක් නිසා මාව අන්ධයෙකු වශයෙන් නැගිට්ට වූවෙහිද? මා (වරක්) හොඳින් ඇස් පෙනෙන්නෙකු වශයෙන් සිටියෙමි" යයි පවසනු ඇත. එවිට (අල්ලාහ්) "අපේ සළකුණු ඔබට පැමිණියා නොවෙද? ඒවා ඔබ (ගණනයට නොගෙන) අමතක කර දැම්මෙහිය. එබැවින් ඔබවද මෙදින අමතක කරන ලදී" . අල්-කුර්ආනය 20:124-6

## ඉන් වන්නේ ඔබ ඔබටම හානි කරගැනීමක් පමණි

දෙවියන්වහන්සේට ඔබේ නැමදුම්වත් වෙනත් කිසිදු දෙයකවත් කිසිවෙකුගෙන් අවශ්‍යතාවයක් නොමැත. සියළු ප්‍රශංසා ඔහුටමය! ඔහුගේ උපකාරය අවශ්‍යවන්නේ ඔබටයි

" දෙවියන්වහන්සේට (අල්ලාහ්ට) කෘතඥතාවය පුද කරනු. කවුරුන් ඔහුට කෘතඥතාවය පුද කරන්නේද එය ඔහුගේ ආත්මයටම හොඳක් වනු ඇත. කවුරුන් කෘතඥ නොවන්නේද නියත වශයෙන්ම අල්ලාහ් සියලු අවශ්‍යතාවයන්ගෙන් නිදහස්ය. සියලු ප්‍රශංසා වලට සුදුස්සා ඔහුය". අල්-කුර්ආනය 31:12

## ඔබ අවිශ්වාසවන්තයෙකි

v1.04

බොහෝ ඉස්ලාමීය විද්වතුන්ගේ මතය අනුව නැමදුම් ඉටුනොකරන්නා අවිශ්වාසවන්තයෙක් වනබව පහත නබි වදන පදනම් කර ගනිමින් පවසයි:

"අපත් ඔවුනුත් (විශ්වාස කරන්නන් හා නොකරන්නන්) වෙන් කරන සාධකය වන්නේ නැමදුමයි. ඊට පිටුපාන තැනැත්තා අවිශ්වාසවන්තයෙකි"

තවද, නබිතුමාගේ අනුගාමිකයින් නැමදුම හැර වෙනත් කිසිඳු ක්‍රියාවක් අත්හැරීම අවිශ්වාසවන්තයෙකුගේ ලක්ෂණයක් ලෙස සැළකුවේ නැත

# නිදහසට කාරණා

වේලාව නොමැතිවීම (රාජකාරි, පාඩම් කටයුතු, කාර්යබහුල බව ආදිය) - පැහැදිලි මුලාවකි. ඔබ නැමදුමට මූලිකත්වය ලබා දී නැත. දෙවියන්වහන්සේ ඔබේ කාලය හා කාර්යයන් වඩාත් සාර්ථක හා කාර්යක්ෂම වීමට ආශිර්වාද කරනු ඇත.

මගේ හදවත පිරිසිදුයි දෙවියන්වහන්සේ පිරිසිදු හදවත ඇති අය කවුරුන්දැයි විමසා බලයි. ඔහු, ඔබේ නැමදුම් අපේක්ෂා කරයි. ඔබගේ ක්‍රියාවන් ඔබේ හදවතෙහි ඇති දේ ප්‍රතිරූපණය කරයි. වඩාත්ම සුපිරිසිදු හදවත සතු වූ මුහම්මද් නබි තුමාණෝ නිරතුරුවම නැමදුමෙහි යෙදුනේ ය.

මගේ එලාමය - එලාමය නිසි ලෙස සකස් නොකළේ නම් එය නිසි වේලාවට නාදවන්නේ ද නැත. ඔබේ චේතනාවන් පිරිසිදුව තබා සුන්නාව පරිදි නින්දට යන්න

මගේ පවුල/සැමියා/බිරිඳ/දෙමව්පියන්/මිතුරන් මාව වළක්වනවා - ''වෙනත් කිසිවෙකුට අවනත වීමට අල්ලාහ්ට අකීකරු විය යුතු නැත'' යැයි නබිතුමාණෝ පවසා සිටියා. ඔබව විනිශ්චය කරනු ලබන්නේ තනිවමය.

මම පව් කරනවා වැඩියි - කාලයත් සමග ඔබේ නැමදුම් ඔබව පාප ක්‍රියාවන් කිරීමෙන් මුදවා ගනියි. එබැවින් නමදින්න - ඔබ පාප ක්‍රියාවන් හි නියලෙන්නේ නැමදුම් ඉටු නොකරන බැවිනි. '' ඉෂා හා ෆජ්ර් නැමදුම්වල ප්‍රතිලාභයන් ඔවුන් දන්නේ නම් ඔවුන් (මසජිදයට) බඩගාමින් හෝ පැමිණෙනු ඇත.'' යන නබිවැකිය මෙනෙහි කර බලන්න

එම දුෂ්කර වූ තීරණාත්මක දිනයේ ඔබ ඔබේ ස්වාමියාට මුහුණ දීමේ දී නැමදුම් මගහැරීම සම්බන්ධයෙන් ඔබට දිය හැකි නිදහසට කාරණා කවරේ ද?

More Information

p (+61) 3 9354-7500 w iisna.com/pamphlets e shareislam@gmail.com

Donation Details (Every $1 AUD donated produces 15 pamphlets)

Bank Name Commonwealth Bank Account Pamphlet Project Australia
BSB 063620 Account 10532332 Swift (international) CTBAAU2S

# දේව නැමදුමෙහි වැදගත් කම



learn the basics

www.iisna.com/pamphlets